# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2303/16 - 2022 ඔක්තෝබර් මස 26 වැනි බදාදා - 2022.10.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී- 3/2013 (iii)

**1971 අංක 52 දරන වෙළඳ නැව් පනත**

1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 126 වන සහ 321 වන වගන්ති යටතේ වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**නිමල් සිරිපාල ද සිල්වා,**
වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍ය

2022 ඔක්තෝබර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2016 ඔක්තෝබර් මස 4 වන දින අංක 1987/19 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි 6 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"6. (අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සම්මුතියේ II වන, III වන සහ V වන පරිච්ඡේදවල විධිවිධානවලට අනුකූලව නෞකාධිපතිවරුන්, නිලධරයන් සහ නිල නොලත් නැවියන්ට නිපුණතා සහතික සහ මූලික පුහුණුව පිළිබඳ නිපුණතා සහතික (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1 වගුව) නිකුත් කරනු ලැබිය යුතු ය.

(ආ) (1) වන උපනියෝගයේ නිශ්චිතව දක්වා ඇති සහතික හැර සම්මුතියෙන් නියම කර ඇති නිපුණතා සහතික නිකුත් කිරීමේ බලය අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් යම් අනුමත පුහුණු ආයතනයක් වෙත පවරනු ලැබිය හැකි ය.".

1A - G 37872 — 08 (2022/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) එහි 8 වන නියෝගයේ (2) වන උපනියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපනියෝග ආදේශ කිරීමෙන්:-

"(2) සුදුසුකම් ලබන සේවය හෝ පුහුණුව ඩ්‍රෙජර් යාත්‍රා, පර්යේෂණ යාත්‍රා, මුක්තාවශේෂ යාත්‍රා, ටග් යාත්‍රා වැනි වාණිජ නොවන නෞකාවල සහ ඊට සමාන කටයුතුවල යෙදී සිටින වෙනත් යාත්‍රාවල සිදු කර ඇති අවස්ථාවක, එම සේවය මේ නියෝගවල 19 වන නියෝගයේ (2) වන සහ (3) වන උපනියෝගවලට අනුකූලව සැලකිය හැකි ය.".

(3) එහි 9 වන නියෝගයේ"ලැබීමෙන් පසු" යන වචන වෙනුවට "ලැබීමෙන් පසු, නෞකාස්ථ පුහුණුව අනුමත වාර්තා පොතක ලේඛනගත කරන්නා වූ ද, නෞකාවල" යන වචන ආදේශ කිරීමෙන්;

(4) එහි 9 වන නියෝගයේ (12) වන උපනියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපනියෝගය ආදේශ කිරීමෙන්:-

"(12) දළ ටොන් 500 හෝ ඊට වැඩි මුහුදු ගමන් නෞකාවල යාත්‍රාකරණ මුරකාවලක කොටසක් වූ සෑම නිල නොලත් නැවියෙකු ම නිසි පරිදි සහතික ලබා තිබිය යුතු අතර, දළ ටොන් 500 හෝ ඊට වැඩි නෞකාවල යාත්‍රාකරණ මුරකාවලක කොටසක් වූ නිල නොලත් නැවියකු ලෙස සහතිකයක් නිකුත් කරනු ලැබීම සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකු ම-

(අ) සහතිකය නිකුත් කිරීම සඳහා වූ පරීක්ෂණය ආරම්භ වන දිනට වයස අවුරුදු දහඅටට නොඅඩු විය යුතු ය;

(ආ) පහත දැක්වෙන දේ සම්පූර්ණ කර තිබිය යුතු ය; එනම්-

(i) පුහුණුව අනුමත පුහුණු වාර්තා පොතක ලේඛනගත කරන්නා වූ මාස හයකට නොඅඩු නෞකාස්ථ පුහුණුවක් ඇතුළුව අනුමත මුහුදු ගමන් සේවා කාලයක්; හෝ

(ii) මාස දෙකකට නොඅඩු වූ අනුමත මුහුදු ගමන් සේවා කාලයක් ඇතුළුව අනුමත පෙර මුහුදු පුහුණු වැඩසටහනක්; හෝ

(iii) මාස දෙකකට නොඅඩු වූ අනුමත මුහුදු ගමන් සේවා කාලයක් ඇතුළුව නෞකාවක විශේෂ නෞකාස්ථ පුහුණුවක්:

එසේ වුව ද, (i) වන, (ii) වන සහ (iii) වන අනුඡේදවලින් නියම කර ඇති මුහුදු ගමන් සේවය, පුහුණුව සහ පළපුරුද්ද යාත්‍රාකරණ මුරසේවා කාර්යය ආශ්‍රිතව විය යුතු අතර, නෞකාධිපතිවරයා, යාත්‍රාකරණ මුරසේවා කාර්ය භාර නිලධරයා හෝ සුදුසුකම්ලත් නිල නොලත් නැවියකුගේ සෘජු අධීක්ෂණය යටතේ අදාළ කාර්ය ඉටු කිරීම ද ඊට ඇතුළත් විය යුතු ය.

(ඇ) පුද්ගලික ගැලවීමේ ශිල්පීය ක්‍රම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-1 වගුව), ගිනි නිවාරණය සහ ගිනි නිවීම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-2 වගුව), මූලික ප්‍රථමාධාර (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-3 වගුව), පුද්ගලික ආරක්ෂාව සහ සමාජයීය වගකීම් (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-4 වගුව) සහ පවරන ලද ආරක්ෂණ කාර්ය (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/6-2 වගුව) සම්බන්ධයෙන් වන අනුමත පුහුණුව සාර්ථකව සම්පූර්ණ කර ඇති බවට ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය; සහ

(ඈ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-II/4 වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරා තිබිය යුතු ය.

(5) එහි 9 (13) (ඇ)නියෝගයේ (ii) වන අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන්:-

"(ii) මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් සමග අනුමත පුහුණු වාර්තා පොතක් සම්පූර්ණ කර තිබිය යුතු ය;" සහ

(6) එහි 9 (13) වන නියෝගයේ (ඉ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඉ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-II/5 වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කර තිබිය යුතු ය.".

(7) එහි 11(1) වන නියෝගයේ (ඈ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඈ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/1 වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම් ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව සහ පරීක්ෂණ සම්පූර්ණ කර තිබිය යුතු ය.";

(8) එහි 11 (5) වන නියෝගයේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඇ) දෙවන ඉංජිනේරු නිලධරයකු වශයෙන් ප්‍රවීණතා සහතිකය ලැබීම සඳහා STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/2 වගුව වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම් ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව සහ පරීක්ෂණ සම්පූර්ණ කර තිබිය යුතු යඃ

එසේ වුව ද,

(i) අපේක්ෂකයා විසින්, පිළිවෙළින්, මෝටර් නෞකා හෝ වාෂ්ප නෞකා සම්බන්ධයෙන් ඉහත (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති අනුමත මුහුදු ගමන් සේවය සම්පූර්ණ කර ඇත් ද යන්න මත පදනම්ව මෝටර් නෞකා හෝ වාෂ්ප නෞකා සඳහා අදාළ වන ප්‍රවීණතා සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකි ය; සහ

(ii) අපේක්ෂකයා විසින් එක් එක් මෝටර් නෞකා සහ වාෂ්ප නෞකා සම්බන්ධයෙන් ඉහත (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති නියමිත මුහුදු ගමන් සේවය සම්පූර්ණ කර ඇත්නම්, මෝටර් නෞකා සහ වාෂ්ප නෞකා සඳහා අදාළ වන ඒකාබද්ධ ප්‍රවීණතා සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකි ය.".

(9) එහි 11 (6) වන නියෝගයේ (ඇ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඇ) උචිත පරිදි, ප්‍රධාන ඉංජිනේරුවරයකු වශයෙන් වන ප්‍රවීණතා සහතිකය ලැබීම සඳහා STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/2 වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම් ඇතුළුව, අනුමත අධ්‍යාපනය, පුහුණුව සහ පරීක්ෂණ සම්පූර්ණ කර තිබිය යුතු යඃ

එසේ වුව ද, ප්‍රධාන ඉංජිනේරු නිලධරයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතිකයක්-

(i) ඉහත (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති මුහුදු ගමන් සේවයෙන් මාස නවයකට නොඅඩු කාලසීමාවක්, මෝටර් නෞකාවක ප්‍රධාන ධාවන යන්ත්‍ර සූත්‍ර අතර ගත කර ඇති වූ ද, ඉතිරි කාලසීමාව වාෂ්ප නෞකාවක හෝ මෝටර් නෞකාවක ප්‍රධාන ධාවන යන්ත්‍ර සූත්‍ර අතර හෝ කවර හෝ නෞකාවක යෝග්‍ය අතුරු යන්ත්‍ර සූත්‍ර අතරගත කර තිබිය හැකි වූ විටෙක, මෝටර් නෞකාවලට අදාළව;

(ii) ඉහත (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති මුහුදු ගමන් සේවයෙන් මාස නවයකට නොඅඩු කාලසීමාවක්, වාෂ්ප නෞකාවක බොයිලේරු සහ ප්‍රධාන ධාවන යන්ත්‍ර සූත්‍ර අතරගත කර ඇත්නම් සහ ඉතිරි කාලසීමාව වාෂ්ප නෞකාවක හෝ මෝටර් නෞකාවක ප්‍රධාන ධාවන යන්ත්‍ර සූත්‍ර අතර හෝ කවර හෝ නෞකාවක යෝග්‍ය අතුරු යන්ත්‍ර සූත්‍ර අතර ගත කර තිබිය හැකි වූ විටක, වාෂ්ප නෞකාවලට අදාළව; හෝ

(iii) මුහුදු ගමන් සේවයෙන් මාස නවයකට නොඅඩු කාලසීමාවක් වාෂ්ප නෞකාවක බොයිලේරු අතර සහ ප්‍රධාන ධාවන යන්ත්‍ර සූත්‍ර තුළ ගත කොට සහ මුහුදු ගමන් සේවයෙන් මාස නවයකට නොඅඩු කාලසීමාවක් මෝටර් නෞකාවක ප්‍රධාන ධාවන යන්ත්‍රසූත්‍ර අතර ගත කොට ඇති විටෙක, ඒකාබද්ධ මෝටර් සහ වාෂ්ප නෞකාවලටඅදාළව නිකුත් කරනු ලැබිය හැකි ය.

(10) එහි 11(7) වන නියෝගයේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඇ) වෙරළාසන්න මුහුදු ගමන්වල නියුතු නෞකා සඳහා අදාළ වන STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/1 වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින්, අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම් ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව සහ පරීක්ෂණ සම්පූර්ණ කර තිබිය යුතු ය:

එසේ වුව ද, වාෂ්ප බොයිලේරු ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සම්බන්ධයෙන් STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/1 වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරා නොමැති ඉංජිනේරු නිලධරයකු වෙත ප්‍රවීණතා සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකි අතර, එම ඉංජිනේරු නිලධරයා විසින් නියමිත ප්‍රවීණතා මට්ටම සපුරාලන තෙක්, වාෂ්ප බොයිලේරු, නෞකාවේ යාන්ත්‍රණයේ කොටසක් වන්නා වූ, යම් නෞකාවක සේවය කිරීම සඳහා එය වලංගු නොවිය යුතු ය."

(11) එහි 11(8) වන නියෝගයේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඇ) වෙරළාසන්න මුහුදු ගමන්වල නියුතු කිලෝවොට් 750ත් කිලෝවොට් 3000ත් අතර ප්‍රචලන බලයකින් යුත් නෞකාවල ප්‍රධාන ඉංජිනේරු නිලධරයන් සහ දෙවන ඉංජිනේරු නිලධරයන් සඳහා STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/3 වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම් ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව සහ පරීක්ෂණ සම්පූර්ණ කර තිබිය යුතු ය.".

(12) එහි 11(9) වන නියෝගයේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඇ) වෙරළාසන්න මුහුදු ගමන්වල නියුතු කිලෝවොට් 750ත් කිලෝවොට් 3000ත් අතර ප්‍රචලන බලයකින් යුත් නෞකාවලට සීමා වූ ප්‍රධාන ඉංජිනේරු නිලධරයන් සඳහා වන ප්‍රවීණතා සහතිකය සම්බන්ධයෙන් STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/3 වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම් ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව සහ පරීක්ෂණ සම්පූර්ණ කර තිබිය යුතු ය.".

(13) එහි 11 වන උපනියෝගයේ (11) වන උපනියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපනියෝගය ආදේශ කිරීමෙන්:-

"(11) කිලෝවොට් 750ක් හෝ ඊට වැඩි ප්‍රචලන බලයකින් යුත් මුහුදු ගමන්වල යෙදෙන නෞකාවක ඇංජින් කාමර මුරකාවලක කොටසක් වූ නැතහොත් එවැනි නෞකාවක වරින් වර මිනිසුන් නොයෙදූ ඇංජින් කාමරයක කාර්ය ඉටු කිරීම සඳහා නම් කළ සෑම නිල නොලත් නැවියෙකුම නිසි පරිදි සහතික ලබා තිබිය යුතු අතර, කිලෝවොට් 750ක් හෝ ඊට වැඩි ප්‍රචලන බලයකින් යුත් නෞකාවල ඉංජිනේරු මුරකාවලෙහි කොටසක් වූ නිල නොලත් නැවියකු ලෙස සහතිකයක් සහතිකයක් නිකුත් කරනු ලැබීමට ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකු ම-

(අ) සහතිකය නිකුත් කිරීම සඳහා වූ පරීක්ෂණය ආරම්භ වන දිනට වයස අවුරුදු දහඅටට නොඅඩු විය යුතු ය;

(ආ) පහත දැක්වෙන අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතු ය; එනම්-

(i) පුහුණුව අනුමත පුහුණු වාර්තා පොතක ලේඛනගත කර ඇත්තා වූ, ඇංජින් කාමර මුරකාවලෙහි යෙදීමේ කර්තව්‍ය ආශ්‍රිතව මාස හයකට නොඅඩු නෞකාස්ථ පුහුණුවක් සහ පළපුරුද්දක් ඇතුළුව අනුමත මුහුදු ගමන් සේවයක්; හෝ

(ii) ඇංජින් කාමර මුරකාවලෙහි යෙදීමේ කර්තව්‍ය ආශ්‍රිතව වූ මාස දෙකකට නොඅඩු අනුමත මුහුදු ගමන් සේවා කාලයක් ඇතුළුව පහත දැක්වෙන පරිදි වූ පෙර මුහුදු පුහුණු වැඩසටහනක්-

(අ) ඇංජින් කාමර මුරකාවලක කොටසක් වූ නිල නොලත් නැවියන් සඳහා වන අනුමත පුහුණුවක්; හෝ

(ආ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/4 වගුවේ නිශ්චිතව දක්වා ඇති ඇංජින් කාමර මුරකාවලෙහි කොටසක් වූ නිල නොලත් නැවියන් සඳහා අවශ්‍ය කරන්නා වූ අවම දැනුම, අවබෝධය සහ නිපුණතාව ආවරණය වන්නා වූ, සමුද්‍ර ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ ඩිප්ලෝමාවක් හෝ සහතිකයක් සඳහා වන අධ්‍යයන අවශ්‍යතා සම්පූර්ණ කිරීම; හෝ

(iii) අනුමත මුහුදු ගමන් සේවා කාලය මාස හතරකට නොඅඩු වූ ද, යටත් පිරිසෙයින්, ඉන් මාස දෙකක්වත් ඇංජින් කාමර මුරකාවලෙහි යෙදීමේ කර්තව්‍ය ආශ්‍රිතව වූ ද සමාගමේ මුහුදු සේවා සහතිකයෙහි සහතික කරන ලද ලේඛනගත අනුමත පුහුණු වාර්තා පොත මගින් තහවුරු කරන ලද, පහත දැක්වෙන පරිදි වූ පෙර මුහුදු පුහුණු වැඩසටහන්;

යාන්ත්‍රික, විද්‍යුත්, ස්වයං යාන්ත්‍රණය හෝ වෙනත් අදාළ ඉංජිනේරු විද්‍යා මාධ්‍යයක් සම්බන්ධයෙන් වන උපාධියක් හෝ ඩිප්ලෝමාවක් හෝ සහතිකයක් සඳහා වන අධ්‍යයන අවශ්‍යතා සම්පූර්ණ කිරීම;

එසේ වුව ද, (i) වන, (ii) වන සහ (iii) වන අනුඡේද මගින් නියම කරන ලද මුහුදු ගමන් සේවය, පුහුණුව සහ පළපුරුද්ද ඇංජින් කාමර මුරකාවලෙහි යෙදීමේ කර්තව්‍ය ආශ්‍රිතව විය යුතු අතර, ඊට සුදුසුකම්ලත් ඉංජිනේරුවකුගේ නැතහොත් සුදුසුකම්ලත් නිල නොලත් නැවියකුගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරනු ලබන කාර්ය කිරීම ද ඇතුළත් විය යුතු ය;

(ඇ) ඇංජින් කාමර මුරකාවලෙහි කොටසක් වූ නිල නොලත් නැවියන් ලෙස සහතික නිකුත් කරනු ලැබීම සඳහා පහත සඳහන් දෑ සම්බන්ධයෙන් වන අනුමත පුහුණුව සාර්ථක ලෙස සම්පූර්ණ කළ බවට ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය. එනම්; පුද්ගලික ගැලවීමේ ශිල්පීය ක්‍රම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-1 වගුව), ගිනි නිවාරණය සහ ගිනි නිවීම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-2 වගුව), මූලික ප්‍රථමාධාර (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-3 වගුව) සහ පුද්ගලික ආරක්ෂාව සහ සමාජයීය වගකීම් (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-4 වගුව) සහ පවරන ලද ආරක්ෂක වගකීම් (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/6-2 වගුව); සහ

(ඇ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/4 වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලිය යුතු ය.

(14) එහි 11 (12) වන නියෝගයේ (ඉ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඉ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/5 වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අනුමත අධ්‍යාපනය, පුහුණුව සහ පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කර තිබිය යුතු ය.".

(15) එහි 12 (1) වන නියෝගයේ (ඈ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඈ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1 වගන්තියේ 2 වන ඡේදය ප්‍රකාර මූලික පුහුණුව, ගැලවීමේ යාත්‍රා සහ වේගවත් ජීවිතාරක්ෂක බෝට්ටු නොවන ජීවිතාරක්ෂක බෝට්ටු පිළිබඳ නිපුණතාව (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/2-1 වගුව), උසස් ගිනි නිවීම් (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/3 වගුව), වෛද්‍ය ප්‍රථමාධාර (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/4-1 වගුව) සහ නෞකා ආරක්ෂක නිලධරයා (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/5 වගුව)පිළිබඳ අනුමත පුහුණුව සාර්ථකව සම්පූර්ණ කළ බවට ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.";

(16) එහි 12 වන නියෝගයේ (2) වන උපනියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපනියෝගය ආදේශ කිරීමෙන්:-

"(2) කිලෝවොට් 750ක් හෝ ඊට වැඩි ප්‍රචලන බලයකින් යුත් ප්‍රධාන ප්‍රචලන යාන්ත්‍රණයක් මගින් බලය සපයනු ලබන, මුහුදු ගමන්වල යෙදෙන නෞකාවක සේවය කරන සෑම විද්‍යුත් කාර්මික නිල නොලත් නැවියකුම නිසි ලෙස සහතික ලබා තිබිය යුතු ය. තවද, එවැනි සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකු ම-

(අ) පරීක්ෂණය ආරම්භ කරන දිනට වයස අවුරුදු දහඅටට නොඅඩු විය යුතු ය;

(ආ) පුහුණුව අනුමත පුහුණු වාර්තා පොතක ලේඛනගත කරන්නා වූ, අදාළ තත්ත්වයේ මාස දොළහකට නොඅඩු පුහුණුව සහ පළපුරුද්ද ඇතුළුව අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; හෝ

(i) නෞකාස්ථ පුහුණුව අනුමත පුහුණු වාර්තා පොතක ලේඛනගත කරන්නා වූ, අදාළ තත්ත්වයේ මාස හයකට නොඅඩු අනුමත මුහුදු ගමන් සේවා කාලයක් ඇතුළුව අනුමත පුහුණුවක් සම්පූර්ණ කර තිබිය යුතු ය; හෝ

(ii) A-III/7 වගුවේ සඳහන් කාර්මික ප්‍රවීණතා සපුරාලන සුදුසුකම් සහ අදාළ තත්ත්වයේ මාස තුනකට නොඅඩු වූ ද සමාගම් මුහුදු සේවා සහතිකයෙහි සහතික කර ඇත්තා වූ ද අනුමත මුහුදු ගමන් සේවා කාලයක් ලබා තිබිය යුතු ය; සහ

(ඇ) පහත සඳහන් දෑ පිළිබඳ අනුමත පුහුණුව සාර්ථකව සම්පූර්ණ කළ බවට ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය. එනම්; පුද්ගලික ගැලවීමේ ශිල්පීය ක්‍රම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-1 වගුව), ගිනි නිවාරණය සහ ගිනි නිවීම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-2 වගුව), මූලික ප්‍රථමාධාර (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-3 වගුව) සහ පුද්ගලික ආරක්ෂාව සහ සමාජයීය වගකීම් (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-4 වගුව) සහ පවරන ලද ආරක්ෂක වගකීම් (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/6-2 වගුව); සහ

(ඉ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/7 වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලිය යුතු ය.

(17) එහි 14 වන නියෝගයේ (5) වන උපනියෝගය ඉවත් කිරීමෙන්.

(18) එහි VIII වන කොටසේ මාතෘකාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන මාතෘකාව ආදේශ කිරීමෙන්:-

**"ඇතැම් නෞකා වර්ගවල නෞකාධිපතිවරුන්, නිලධරයන්, නිල නොලත් නැවියන් සහ වෙනත් සේවක පිරිස්වල පුහුණුව සහ සුදුසුකම් සඳහා වූ අනිවාර්ය අවම නියමයන්".**

(19) එහි 15 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් නියෝග ආදේශ කිරීමෙන්:-

"15. (1) ජාත්‍යන්තර මුහුදු ගමන්වල නියුතු මගී නෞකාවල නෞකාස්ථ කාර්ය පවරනු ලැබීමට පෙරාතුව, නෞකාධිපතිවරුන්, නිලධරයන්, නිල නොලත් නැවියන් සහ වෙනත් සේවක පිරිස් විසින් ඔවුන්ගේ ශක්නුතාව, කාර්ය සහ වගකීම්වලට අනුකූලව (2) වන, (3) වන, (4) වන, (5) වන සහ (6) වන ඡේද මගින් නියම කර ඇති පුහුණුව සම්පූර්ණ කර තිබිය යුතු ය.

(2) මගී නෞකාවල සේවය කරන නෞකාධිපතිවරුන්, නිලධරයන්, නිල නොලත් නැවියන් සහ වෙනත් සේවක පිරිස් විසින් STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1වගන්තියේ 1 වන ඡේදයේ නියමයන් සපුරාලිය යුතු ය.

(3) මගී නෞකාවල නෞකාස්ථව, මගී අවකාශවල සිටින මගීන්ට ඍජුව සේවය සපයනු ලබන සේවක පිරිස් විසින් STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-V/2 වගන්තියේ 2 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ආරක්ෂක පුහුණුව සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

(4) II වන, III වන සහ VII වන පරිච්ඡේදවලට අනුකූලව සුදුසුකම්ලත් මගී නෞකාවල නෞකාධිපතිවරුන්, නිලධරයන්, නිල නොලත් නැවියන් සහ එකී මගී නෞකාවල නෞකාස්ථව ඇති වන්නා වූ හදිසි අවස්ථාවල දී මගීන්ට සහායවීම පිණිස පෙරෙට්ටු ලැයිස්තුව මගින් නම් කරන ලද වෙනත් සේවක පිරිස් විසින් STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-V/2 වගන්තියේ 3 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති මගී නෞකා පිරිස් කළමනාකරණය පිළිබඳ පුහුණුව සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

(5) මගී නෞකාවල නෞකාධිපතිවරුන්, ප්‍රධාන ඉංජිනේරු නිලධරයන්, ප්‍රධාන උපනැව්පතිවරුන්, දෙවන ඉංජිනේරු නිලධරයන් සහ එකී නෞකාවල නෞකාස්ථ වූ මගීන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් හදිසි අවස්ථාවල දී වගකීම දරන්නන් ලෙස පෙරෙට්ටු ලැයිස්තුව මගින් නම් කරන ලද යම් තැනැත්තකු විසින් STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-V/2 වගන්තියේ 4 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති අර්බුදකාරී තත්ත්ව කළමනාකරණය සහ මනුෂ්‍ය හැසිරීම් පිළිබඳ අනුමත පුහුණුව සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

(6) රෝ-රෝ මගී නෞකාවල නෞකාධිපතිවරුන්, ප්‍රධාන ඉංජිනේරු නිලධරයන්, ප්‍රධාන උපනැව්පතිවරුන්, දෙවැනි ඉංජිනේරු නිලධරයන් සහ එකී නෞකාවල නෞකාස්ථ මගීන් නැව් නැගීම සහ නැවෙන් බැසීම, නැව් බඩු පැටවීම, බෑම හෝ සුරැකීම හෝ නැව් බඳ විවර වැසීම පිළිබඳ ආසන්නතම වගකීම පවරනු ලැබ ඇති සෑම තැනැත්තකු විසින් ම STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-V/2 වගන්තියේ 5 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති මගී ආරක්ෂාව, නැව් බඩු ආරක්ෂාව සහ නැව් බඳේ සම්පූර්ණත්වය පිළිබඳ අනුමත පුහුණුව සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

15අ. (1)ධ්‍රැවීය ජල තීරයේ ක්‍රියාත්මක වන නෞකාවල නෞකාස්ථ කාර්ය පවරනු ලැබීමට පෙරාතුව, එකී නෞකාවල නෞකාධිපතිවරුන්, ප්‍රධාන උපනැව්පතිවරුන් සහ යාත්‍රාකරණ මුරකාවලක් භාර නිලධරයන් විසින් ධ්‍රැවීය ජලතීරයේ ක්‍රියාත්මක වන නෞකා සඳහා වන මූලික පුහුණුව පිළිබඳ සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතිකයක් ලබා ගැනීමට අපේක්ෂා කරන සෑම අපේක්ෂකයකු විසින් ම ධ්‍රැවීය ජල තීරයේ ක්‍රියාත්මක වන නෞකා සඳහා වන අනුමත මූලික පුහුණුවක් සම්පූර්ණ කර තිබිය යුතු අතර, STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-V/4 වගන්තියේ 1 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරා තිබිය යුතු ය.

(2) ධ්‍රැවීය ජල තීරයේ ක්‍රියාත්මක වන නෞකාවල නෞකාධිපතිවරුන් සහ ප්‍රධාන උපනැව්පතිවරුන් විසින් ධ්‍රැවීය ජල තීරයේ ක්‍රියාත්මක වන නෞකා සඳහා වන උසස් පුහුණුව පිළිබඳ සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතිකයක් ලබා ගැනීමට අපේක්ෂා කරන සෑම අපේක්ෂකයකු විසින් ම-

(අ) මේ නියෝගයේ (1) වන උපනියෝගයේ නිශ්චිතව දක්වා ඇති මූලික පුහුණුව පිළිබඳ සහතිකයක් ලබා ගැනීම සඳහා වන නියමය සපුරාලිය යුතු ය;

(ආ) ධ්‍රැවීය ජල තීරය ඇතුළත නැව් තට්ටු අංශයේ, කළමනාකරණ මට්ටමේ හෝ මෙහෙයුම් මට්ටමේ මුරකාවලෙහි යෙදීමේ කාර්ය කරන අතරතුර, යටත් පිරිසෙයින්, මාස දෙකක් වත් අනුමත මුහුදු ගමන් සේවයක් හෝ ඒ හා සමාන වෙනත් අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; සහ

(ඇ) ධ්‍රැවීය ජල තීරයේ ක්‍රියාත්මක වන නෞකා සඳහා වන අනුමත උසස් පුහුණුව සම්පූර්ණ කර තිබිය යුතු අතර, STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-V/4 වගන්තියේ 2 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලිය යුතු ය.

15ආ. (1) IGF ව්‍යවස්ථා සංග්‍රහයට යටත් නෞකාවල නෞකාස්ථ කාර්ය පවරනු ලැබීමට පෙරාතුව, මුහුදු යාත්‍රාකරුවන් විසින්, ඔවුන්ගේ ශක්නුතාව, කාර්ය සහ වගකීම්වලට අනුකූලව (2) වන, (3) වන සහ (4) වන උපනියෝගවලින් නියම කර ඇති පුහුණුව සම්පූර්ණ කර තිබිය යුතු ය.

(2) IGF ව්‍යවස්ථා සංග්‍රහයට යටත් නෞකාවල නෞකාස්ථව සේවය කරන සියලු මුහුදු යාත්‍රාකරුවන් විසින්, නෞකාස්ථ කාර්ය පවරනු ලැබීමට පෙරාතුව, 31 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති උචිත නෞකා සහ උපකරණ සඳහා විශේෂ වූ හුරුවීමක් ලබා ගත යුතු ය.

(3) IGF ව්‍යවස්ථා සංග්‍රහයට යටත් නෞකාවල නෞකාස්ථ ඉන්ධනවල ආරක්ෂාව, භාවිතය හෝ හදිසි ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් වන, පවරා ඇති ආරක්ෂක කාර්ය සම්බන්ධයෙන් වගකීම දරන මුහුදු යාත්‍රාකරුවන් විසින්, IGF ව්‍යවස්ථා සංග්‍රහයට යටත් නෞකාවල සේවය කිරීම සඳහා වන මූලික පුහුණුව පිළිබඳ සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතිකයක් ලබා ගැනීමට අපේක්ෂා කරන සෑම අපේක්ෂකයකු විසින් ම STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-V/3 වගන්තියේ 1 වන ඡේදයේ විධිවිධානවලට අනුකූලව මූලික පුහුණුව සම්පූර්ණ කර තිබිය යුතු ය.

(4) IGF ව්‍යවස්ථා සංග්‍රහයට යටත් නෞකාවල නෞකාස්ථ ඉන්ධනවල ආරක්ෂාව, භාවිතය හෝ හදිසි ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් වන පවරා ඇති ආරක්ෂක කාර්ය සම්බන්ධයෙන් වගකීම දරන්නා වූ ද, ද්‍රවීකෘත වායු ටැංකර නෞකා සම්බන්ධයෙන් V/1-2 නියෝගයේ 2 වන සහ 5 වන ඡේද හෝ /1-2 නියෝගයේ 4 වන සහ 5 වන ඡේදවලට අනුකූලව සුදුසුකම් සහ සහතික ලබා ඇත්තා වූ ද මුහුදු යාත්‍රාකරුවන් IGF ව්‍යවස්ථා සංග්‍රහයට යටත් නෞකාවල සේවය කිරීම සඳහා වන මූලික පුහුණුව සම්බන්ධයෙන් A-V/3 වගන්තියේ 1 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති නියමයන් සපුරා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) (අ) IGF ව්‍යවස්ථා සංග්‍රහයට යටත් නෞකාවල නෞකාධිපතිවරුන්, ඉංජිනේරු නිලධරයන් සහ එකී නෞකාවල ඉන්ධන සහ ඉන්ධන පද්ධතිවල ආරක්ෂාව සහ භාවිතය සම්බන්ධයෙන් ආසන්නතම වගකීම දරන සියලු සේවක පිරිස් විසින්, IGF ව්‍යවස්ථා සංග්‍රහයට යටත් නෞකාවල සේවය කිරීම සඳහා වන උසස් පුහුණුව පිළිබඳ සහතිකයක් දරනු ලැබිය යුතු ය.

(ආ) IGF ව්‍යවස්ථා සංග්‍රහයට යටත් නෞකාවල සේවය කිරීම සඳහා වන උසස් පුහුණුව පිළිබඳ සහතිකයක් ලබා ගැනීමට අපේක්ෂා කරන සෑම අපේක්ෂකයකු විසින් ම, 15ආ(3) අනුඡේදයෙන් නියම කරන ලද නිපුණතා සහතිකයක් දරන අතරම-

(i) IGF ව්‍යවස්ථා සංග්‍රහයට යටත් නෞකාවල සේවය කිරීම සඳහා වන අනුමත උසස් පුහුණුව සම්පූර්ණ කර තිබිය යුතු අතර, STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-V/3 වගන්තියේ 2 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරා තිබිය යුතු ය; සහ

(ii) IGF ව්‍යවස්ථා සංග්‍රහයට යටත් නෞකාවල අවම වශයෙන් නෞකාස්ථව තෙල් පැටවීමේ මෙහෙයුම් තුනක්වත් ඇතුළත් වන, යටත් පිරිසෙයින්, මසක කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය. එකී තෙල් පැටවීමේ මෙහෙයුම් තුනෙන් දෙකක්, ඉහත (i) අනුඡේදයේ සඳහන් පුහුණුවේ කොටසක් ලෙස තෙල් පැටවීමේ මෙහෙයුම් පිළිබඳ වූ අනුමත අනුකාරක පුහුණුවක් මගින් ප්‍රතියෝජනය කරනු ලැබිය හැකි ය.

(ඇ) ද්‍රවීකෘත වායු ටැංකර නෞකාවල සේවය කිරීම සම්බන්ධයෙන් A-V/1-2 වගන්තියේ 2 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීණතා මට්ටම්වලට අනුකූලව සුදුසුකම් සහ සහතික ලබා ඇත්තා වූ, IGF ව්‍යවස්ථා සංග්‍රහයට යටත් නෞකාවල නෞකාධිපතිවරුන්, ඉංජිනේරු නිලධරයන් සහ එකී නෞකාවල ඉන්ධනවල ආරක්ෂාව සහ භාවිතය සම්බන්ධයෙන් ආසන්නතම වගකීම දරන යම් තැනැත්තකු IGF ව්‍යවස්ථා සංග්‍රහයට යටත් නෞකා සඳහා වන උසස් පුහුණුව සම්බන්ධයෙන් A-V/3 වගන්තියේ 2 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති නියමයන් සපුරා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ සඳහා ඔවුන් විසින් -

(i) 15ආ (3) වන ඡේදයේ නියමයන් සපුරා තිබිය යුතු ය; සහ

(ii) ඉහත 15ආ (5) (ආ) (ii) වන ඡේදයේ සඳහන් තෙල් පැටවීම පිළිබඳ නියමයන් සපුරා තිබිය යුතු ය; නැතහොත් ද්‍රවීකෘත වායු ටැංකර නෞකාවල නෞකාස්ථ නැව් බඩු මෙහෙයුම් තුනක් සිදු කිරීම සඳහා සහභාගී වී තිබිය යුතු ය; සහ

(iii) පසුගිය වසර පහ තුළ-

(අ) IGF ව්‍යවස්ථා සංග්‍රහයට යටත් නෞකාවල;

(ආ) නැව් බඩු ලෙස IGF ව්‍යවස්ථා සංග්‍රහයෙන් ආවරණය වන ඉන්ධන රැගෙන යන ටැංකර නෞකාවල; හෝ

(ඇ) ඉන්ධන ලෙස වායූන් හෝ අඩු ජ්වලනාංකයක් සහිත ඉන්ධන භාවිත කරන නෞකාවල,

නෞකාස්ථව මාස තුනක මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.”.

(20) එහි 19 (2) වන නියෝගයේ"සම්පූර්ණයෙන් ගණන් ගත හැකි වන්නේ, නියම වශයෙන් මුහුදේ ගත කරන ලද කාලය, නැවේ ගත කළ මුළු කාලයෙන් තුනෙන් දෙකක් වන හෝ ඊට වැඩි කාලයක් වන විට ය. නියම වශයෙන් මුහුදු සේවා කාලය මෙම ප්‍රමාණයට වඩා අඩු නම්, නියම වශයෙන් ඉටු කරන ලද මුහුදු සේවා කාලයෙන් එක හමාරක ගුණයක් සුදුසුකම් ලැබීමේ මුහුදු සේවා කාලය වශයෙන් ගණන් ගත හැකි ය." යන වචන වෙනුවට "නියමිත මුහුදු සේවයෙන් අඩක් ලෙස ගණන් ගත හැකි වන්නේ, නියම වශයෙන් මුහුදේ ගත කරන ලද කාලය, නැවේ නෞකාස්ථව සේවය කළ මුළු කාලයෙන් තුනෙන් දෙකක් වන හෝ ඊට වැඩි කාලයක් වන විට ය. නියම මුහුදු ගමන් සේවා කාලය මෙම ප්‍රමාණයට වඩා අඩු නම්, නියම මුහුදු ගමන් සේවයෙන් එකහමාරක ගුණයක් "නියමිත සුදුසුකම් ලැබීමේ මුහුදු ගමන් සේවයෙන් අඩක්" ලෙස ගණන් ගත හැකි ය." යන වචන ආදේශ කිරීමෙන්;

(21) එහි 22 (2) වන නියෝගයේ "සුදුසුකම් ලබා ඇති බවට දැන්වීමක් නිකුත් කළ යුතු ය." යන වචන වෙනුවට "සුදුසුකම් ලබා ඇති බවට වන ලිපියක් නිකුත් කළ යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(22) එහි 22 වන නියෝගයේ (6) වන උපනියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපනියෝග ඇතුළත් කිරීමෙන්:-

"(7) (2) වන උපනියෝගයේ සඳහන් සුදුසුකම් ලබා ඇති බවට වන ලිපියේ වලංගු කාලසීමාව එය නිකුත් කළ දින සිට වසර 5 ක් නොඉක්මවිය යුතු ය.

(8) මේ නියෝගවල නිශ්චිතව දක්වා ඇති ප්‍රවීණතා සහතිකයක් හෝ නිපුණතා සහතිකයක් ලබා ගැනීමට අවශ්‍ය කරන වාචික ඇගයීම් ඇතුළු සියලු පරීක්ෂණ සුදුසුකම් ලබා ඇති බවට වන ලිපියේ වලංගු කාලසීමාව ඇතුළත සම්පූර්ණ කළයුතු ය.".

(23) එහි 26 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"26. (1)STCW සම්මුතියේ 1/11(සහතික නැවත වලංගු කිරීමේ) නියෝගය යටතේ නියම කර ඇති සියලු ප්‍රවීණතා සහතික සඳහා වන අඛණ්ඩ වෘත්තීය ප්‍රවීණතාව:-

(අ) යටත් පිරිසෙයින්,-

(i) පසුගිය වසර පහ තුළ එකතුව මාස දොළහක්වත් වන; හෝ

(ii) නැවත වලංගු කිරීමට පෙරාතුව ම වූ මාස හය තුළ එකතුව මාස තුනක්වත් වන,

කාලසීමාවක්, අදාළ නිලය සඳහා දරනු ලබන ප්‍රවීණතා සහතිකයට අදාළ කර්තව්‍ය ඉටු කරමින් කරනු ලබන අනුමත මුහුදු ගමන් සේවයකින්; හෝ

(ආ) (අ) සහ (i) ඡේදවලින් නියම කර ඇති මුහුදු ගමන් සේවයට සමාන බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සලකනු ලබන කර්තව්‍ය ඉටු කිරීමෙන්; හෝ

(ඇ) අනුමත පරීක්ෂණයක් සමත් වීමෙන්; හෝ

(ඈ) අනුමත පුහුණු පාඨමාලාවක් හෝ පුහුණු පාඨමාලා සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන්; හෝ

(ඉ) අතිරේක තත්ත්වයකින් මාස තුනකට නොඅඩු කාලසීමාවක් දරනු ලබන සහතිකයට අදාළ කර්තව්‍ය ඉටු කරමින් කරනු ලබන අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කිරීමෙන්,

සනාථ කළ යුතු ය.

(2) සහතිකයක් නැවත වලංගු කිරීම සඳහා වන ඉල්ලීමක් මාස හයක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, වලංගු දින සිට වසර පහක් ගතවන දින තෙක් සහතිකය නැවත වලංගු කළ හැකි අතර, ඉහත නිශ්චිතව දක්වා ඇති කාලසීමාවට පෙර ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, ආසන්නතම නිදහස් කිරීමේ සිට වසර පහක් දක්වා සහතිකය නැවත වලංගු කළ යුතු ය. තවද, ඉහත සඳහන් කාලසීමාවෙන් පසු ඉල්ලීමක් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්කරුවන් සම්බන්ධයෙන් වන විට, සහතිකයේ සඳහන් දින සිට වසර පහක් දක්වා සහතිකය නැවත වලංගු කළ යුතු ය.

(3) (අ) (1) වන උපනියෝගයේ (ඈ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති පුහුණු පාඨමාලාව මුහුදේ දී ජීවිතාරක්ෂාව, ආරක්ෂාව සහ සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීමට අදාළ ජාතික සහ ජාත්‍යන්තර නියෝගවලට සිදු කර ඇති වෙනස්කම් ද ඇතුළත් විය යුතු අතර, එහිදී අදාළ ප්‍රවීණතා මට්ටම යාවත්කාලීන කිරීම පිළිබඳව ද සැලකිල්ලට ගනු ලැබිය යුතු ය. තවද, එම පුහුණු පාඨමාලාව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

(ආ) (1) වන උපනියෝගයේ (ඈ) ඡේදයේ සඳහන් පුහුණු පාඨමාලාවට සහභාගීවීම සඳහා වන අවම අවශ්‍යතාව විය යුත්තේ, පසුගිය වසර දහය ඇතුළත දරනු ලැබූ ප්‍රවීණතා සහතිකය සම්බන්ධයෙන් අවම වශයෙන් මාස දොළහක් වූ මුහුදු ගමන් සේවයක් වන්නේ ය.

(ඇ) (3) වන උපනියෝගයේ (ආ) අනුඡේදයේ නිශ්චිතව දක්වා ඇති අවම අවශ්‍යතාව සපුරා නොමැති මුහුදු යාත්‍රාකරුවකු විසින්, දරනු ලබන ප්‍රවීණතා සහතිකය සම්බන්ධයෙන් වන අදාළ ලිඛිත සහ වාචික පරීක්ෂණ සමත් විය යුතු ය.

(4) STCW සම්මුතියේI/11 නියෝගයේ 3 වන ඡේදය යටතේ නියම කර ඇති පරිදි ටැංකර නෞකා සඳහා වන අඛණ්ඩ වෘත්තීය ප්‍රවීණතාව-

(අ) යටත් පිරිසෙයින්, නැවත වලංගු කිරීම සඳහා වන ඉල්ලීම ඉදිරිපත් කළ දිනට පෙරාතුව වූ වසර පහක කාලය තුළ එකතුව මාස තුනක්වත් වන කාලසීමාවක්, දරනු ලබන ටැංකර නෞකා සහතිකයට හෝ පිටසන් කිරීමට අදාළ කාර්ය ඉටු කරමින් සිදු කරනු ලබන අනුමත මුහුදු ගමන් සේවයක් මගින්; හෝ

(ආ) අනුමත අදාළ පුහුණු පාඨමාලාවක් හෝ පුහුණු පාඨමාලා සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම මගින්,

සනාථ කළ යුතු ය.

(5) I/II නියෝගය යටතේ නියම කර ඇති පරිදි ධ්‍රැවීය ජල තීරයේ ක්‍රියාත්මක වන නෞකාවල නෞකාස්ථ වූ නෞකාධිපතිවරුන් සහ නිලධරයන් සඳහා වන අඛණ්ඩ වෘත්තීය ප්‍රවීණතාව-

(අ) යටත් පිරිසෙයින්, නැවත වලංගු කිරීම සඳහා වන ඉල්ලීම ඉදිරිපත් කළ දිනට පෙරාතුව වූ වසර පහක කාලය තුළ එකතුව මාස දෙකක්වත් වන කාලසීමාවක්, දරනු ලබන සහතිකයට අදාළ කර්තව්‍ය ඉටු කරමින් සිදු කරනු ලබන අනුමත මුහුදු ගමන් සේවයක් මගින්; හෝ

(ආ) (4)(අ) ඡේදයෙන් නියම කර ඇති මුහුදු ගමන් සේවයට සමාන යයි සලකනු ලබන කර්තව්‍ය ඉටු කිරීම මගින්; හෝ

(ඇ) අනුමත පරීක්ෂණයක් සමත් වීම මගින්; හෝ

(ඈ) 15අ නියෝගයේ (1) වන සහ (2) වන උපනියෝගවල සඳහන් අදාළ සහ අනුමත පුහුණු පාඨමාලාවක් හෝ පුහුණු පාඨමාලා සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම මගින්,

සනාථ කළ යුතු ය.

(6) IGF ව්‍යවස්ථා සංග්‍රහය යටතේ මූලික පුහුණුව හෝ උසස් පුහුණුව පිළිබඳ නිපුණතා සහතික දරන මුහුදු යාත්‍රාකරුවන් විසින්, වසර පහක් නොඉක්මවන කාලසීමාවන්හි දී, උචිත සංස්කරණ පුහුණුවක් ලබා ගත යුතු ය; නැතහොත් නැවත වලංගු කිරීම සඳහා වන ඉල්ලීම ඉදිරිපත් කළ දිනට පෙරාතුව වූ වසර පහ තුළ, යටත් පිරිසෙයින්, මාස හයක්වත් වූ කාලසීමාවක දී නියමිත ප්‍රවීණතා මට්ටම ළඟා කර ගෙන ඇති බවට වූ සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

(7) මගී නෞකාවල අනුමත පිරිස් කළමනාකරණය පිළිබඳ පුහුණුව, අර්බුදකාරී තත්ත්ව කළමනාකරණය, මනුෂ්‍ය හැසිරීම් හෝ මගී ආරක්ෂාව, නැව් බඩු ආරක්ෂාව සහ නැව් බඳේ සම්පූර්ණත්වයට අනුකූලව පුහුණු වූ මගී නෞකාවල නෞකාධිපතිවරුන්, නිලධරයන්, නිල නොලත් නැවියන් සහ වෙනත් සේවක පිරිස් විසින්, වසර පහක් නොඉක්මවන කාලසීමාවන් හි දී, උචිත සංස්කරණ පුහුණුව ලබා ගත යුතු ය; නැතහොත් නැවත වලංගු කිරීම සඳහා වන ඉල්ලීම ඉදිරිපත් කළ දිනට පෙරාතුව වූ වසර පහක කාලය තුළ, යටත් පිරිසෙයින්, මාස හයක් වූ කාලසීමාවක නියමිත ප්‍රවීණතා මට්ටම ළඟා කර ගෙන ඇති බවට වූ සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

(8) (අ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ II/4 නියෝගය (ව්‍යවස්ථා සංග්‍රහයේ A-II/4 වගුව),II/5 නියෝගය(ව්‍යවස්ථා සංග්‍රහයේ A-II/5 වගුව), III/4 නියෝගය (ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/4 වගුව),III/5 නියෝගය (ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/5 වගුව) සහ III/7 නියෝගය (ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/7 වගුව) යටතේ නිකුත් කරන ලද නිපුණතා සහතිකවල වලංගු කාලසීමාව එම සහතික නිකුත් කළ දින සිට වසර පහක් නොඉක්මවිය යුතු ය; සහ

(ආ) (8)(අ) උපනියෝගයේ සඳහන් නිපුණතා සහතික නැවත වලංගු කිරීමට අපේක්ෂා කරන සෑම අපේක්ෂකයකු විසින් ම-

(i) යටත් පිරිසෙයින්, පසුගිය වසර පහක කාලය තුළඑකතුව මාස තුනක්වත් වූ කාලසීමාවක් දරනු ලබන සහතිකයට අදාළ කාර්ය ඉටු කරමින් සිදු කරන ලද අනුමත මුහුදු ගමන් සේවය පිළිබඳ ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; හෝ

(ii) උචිත අනුමත සංස්කරණ සහ යාවත්කාලීන කිරීමේ පුහුණු වැඩසටහනක් සම්පූර්ණ කර තිබිය යුතු ය; හෝ

(iii) අනුමත පරීක්ෂණයක් සමත් වී තිබිය යුතු ය.

(ඇ) ඉල්ලීම කළ දින සිට වසර පහක කාලසීමාවක් සඳහා අලුත් සහතිකය නිකුත් කළ යුතු ය."

(24) එහි 28 වන නියෝගයේ (3) වන උපනියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපනියෝගය ආදේශ කිරීමෙන්:-

"(3)(අ) (4) වන උපනියෝගයේ සිට (12) වන උපනියෝගය දක්වා වන උපනියෝගවලට ((6) වන සහ (7) වන උපනියෝග හැර) අනුකූලව සුදුසුකම් ලැබූ මුහුදු යාත්‍රාකරුවන් විසින්, සෑම වසර පහකට වරක් ම, අනුමත සංස්කරණ සහ යාවත්කාලීන කිරීමේ පුහුණු පාඨමාලාවට සහභාගී විය යුතු ය.

(ආ) (අ) අනුඡේදයේ සඳහන් සංස්කරණ සහ යාවත්කාලීන කිරීමේ පුහුණු පාඨමාලාවට සහභාගීවීම සඳහා වන අවම අවශ්‍යතාව, යටත් පිරිසෙයින්, නැවත වලංගු කිරීම සඳහා වන ඉල්ලීම ඉදිරිපත් කළ දිනට පෙරාතුව වූ වසර පහ තුළඑකතුව මාස තුනක්වත් වන කාලසීමාවක් විය යුතු ය.

(ඇ) (3) වන උපනියෝගයේ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති අවම අවශ්‍යතාව සපුරා නොමැති මුහුදු යාත්‍රාකරුවකු විසින් අදාළ පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සඳහා සහභාගී විය යුතු ය.".

(25) 36 වන නියෝගයේ (2) වන උපනියෝගය එහි 2 (අ) උපනියෝගය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(26) එහි 36 වන නියෝගයේ නැවත අංකනය කරන ලද 2 (අ) උපනියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ආ) STCW සම්මුතිය, අදාළ නියෝග සහ ප්‍රමිතීන්වලට අනුකූලව කටයුතු කිරීම පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා අනුමත වෛද්‍ය වෘත්තිකයන්ගේ පහසුකම්,අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරනු ලබන විගණකරුවන් කණ්ඩායමක් විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.".

(27) එහි 36(4)(අ) නියෝගයේ "වයසින් අවුරුදු 18ට අඩු නොවිය යුතු ය;" යන වචන වෙනුවට "වයස අවුරුදු දහසයට නොඅඩු විය යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන්;

(28) එහි 36 (5) වන නියෝගයේ "මුහුදු යාත්‍රිකයා වයසින් අවුරුදු 55ට වැඩි තැනැත්තකු වන්නේ නම්," යන වචන වෙනුවට "මුහුදු යාත්‍රාකරු වයස අවුරුදු දහඅටට අඩු හෝ වයස අවුරුදු පනස් පහට වැඩි තැනැත්තකු වන්නේ නම්," යන වචන ආදේශ කිරීමෙන්.

(29) 38 වන නියෝගයේ (5) වන උපනියෝගයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපනියෝගය ඇතුළත් කිරීමෙන්:-

"(6) මේ නියෝගයේ කාර්ය සඳහා, විගණනයට යටත් වන ප්‍රදේශ STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-1/16 වගන්තියේ දැක්වෙන්නේ ය.".

(30) 39 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"39. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අදාළ ජාත්‍යන්තර සමුද්‍රිය සංවිධානයේ යෝජනා සම්මතයන්හි පරීක්ෂණ සඳහා වන වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහයේ සංශෝධනවල ඇතුළත් විධිවිධාන, නිර්දේශ සහ මාර්ගෝපදේශ සකස් කිරීම සඳහා විස්තරාත්මක කාර්ය පටිපාටියක් නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මේ නියෝගවල විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පරිදි, සම්මුතියේ විධිවිධානවල සඳහන් අවම ප්‍රමිතීන්වලට අනුකූලව කටයුතු කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් නිකුත් කරනු ලැබිය හැකි ය.".

(31) එහි 41 වන නියෝගයේ:-

(අ) "GT" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්-

"අධි වෝල්ටීය" යන්නෙන්, වෝල්ට් 1000 ඉක්මවන ප්‍රත්‍යාවර්තක ධාරා (AC) හෝ සරල ධාරා (DC) වෝල්ටීයතාවක් අදහස් වේ;"

"IGFව්‍යවස්ථා සංග්‍රහය" යන්නෙන්, වායූන් හෝ වෙනත් අඩු ජ්වලනාංකයක් සහිත ඉන්ධන භාවිත කරන නෞකා සඳහා වන ආරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර ව්‍යවස්ථා සංග්‍රහය අදහස් වේ;"

(ආ) "මගී නෞකාව" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

"ධ්‍රැවීය කේතය" යන්නෙන්, SOLASනියෝගවල XIV/1-1 හි අර්ථ නිරූපනය කර ඇති පරිදි ධ්‍රැවීය ජල තීරයේ ක්‍රියාත්මක වන නෞකා සඳහා වන ජාත්‍යන්තර ව්‍යවස්ථා සංග්‍රහය අදහස් වේ;

"ධ්‍රැවීය ජල තීරය" යන්නෙන්, SOLAS නියෝගවල XIV/1.2 සිටXIV/1.4 දක්වා අර්ථ නිරූපණය කර ඇති පරිදි ආක්ටික් ජල තීරය හෝ ඇන්ටාක්ටික් ප්‍රදේශය අදහස් වේ;"

EOG 10-0241

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.